# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 ජුනි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමර සතරසිංහ මහතා 2018 ජුනි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2.5%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය මැයි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2.1%ක් ලෙස වාර්තා විය. තවද පසුගිය මාස හතර තුළදීම උද්ධමනය 3.0% ට වඩා අඩු අගයක් වාර්තා විය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 0.26%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.26%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 ජුනි මාසයේ 6.3% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 3.9%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.4%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 මැයි මාසයේ 124.3ක් වූ දර්ශකාංකය 2018 ජුනි මාසයේ 126.5ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 ජුනි මාසයේ දර්ශකාංකය 2.2ක වැඩිවීමක් එනම් 1.8ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.55%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.26%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, අළුත් මාළු, අමු මිරිස්, අර්තාපල්, ලොකුළුණු, බිත්තර, කිරිපිටි, කරවල, ඉඟුරු, සහ කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පොල්, කෙසෙල්, දෙහි, සහල්, සීනි, අන්නාසි, කඩල සහ අඹ යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 ජුනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන', 'ආපනශාලා සහ හෝටල්', 'විවිධ භාණ්ඩ හා සේවා' සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ඉන්ධන (පෙට්‍රල් හා ඩීසල්) මිල ඉහළ දැමීම හා බස් ගාස්තු වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීමක් වාර්තා විය. මෙම මස තුළ 'සෞඛ්‍ය', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවීය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව